# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2370/11 - 2024 පෙබරවාරි මස 07 වැනි බදාදා - 2024.02.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 94/47 (IX)

**(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය යටතේ වන නියමය

(269 වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2)(ආ) වගන්තිය සහ 21(2)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති "උද්ධකන්දර රජමහා විහාර පූජා භූමි ප්‍රදේශය" යනුවෙන් හඳුන්වනු ලබන භූමි ප්‍රදේශය, නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවට ප්‍රකාශයට පත් කරනු ලැබේ; සහ

(ආ) "උද්ධකන්දර රජමහා විහාර පූජා භූමි ප්‍රදේශය" සඳහා පරිබාහිර සැලැස්මක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 පෙබරවාරි මස 06 වන දින,
කොළඹ දී ය.

1A - G 41376 — 16 (2024/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

### උපලේඛනය

### *උද්ධකන්දර රජමහා විහාර පූජා භූමිය සංයුක්ත වන භූමි ප්‍රදේශය*

දකුණු පළාතේ, හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාගම් පත්තුව සුළු කොට්ඨාසයේ, (අංක 13) රණකෙළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, රණකෙළිය ග්‍රාමයේ පිහිටි, සර්වේයර් ජනරාල්වරයාගේ 2018 ජුනි මස 08 දිනැති එෆ්. ටී. පී. අංක 2 දරන අවසාන හුලක්ෂණාත්මක පිඹුරෙහි දක්වා ඇති පරිදි කැබලි අංක 8330 සංයුක්ත වන හෙක්ටයාර් 7.7187ක විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශයඃ-

**කැබලි අංක 8330 - යෝධකණ්ඩියගොඩාන**

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැඩැස්තර පිඹුරු අංක 830080, ඉහත සඳහන් සර්වෙයර් ජනරාල්වරයාගේ පිඹුරෙහි කැබලි අංක 1[v] කැබලි අංක 8329 සහ කැබලි අංක 8331 |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 8331 |
| *දකුණට* | : | කැබලි අංක 8331 |
| *බස්නාහිරට* | : | ඉහත සඳහන් සර්වේයර් ජනරාල්වරයාගේ පිඹුරෙහි කැබලි අංක 8331, කැඩැස්තර පිඹුරු අංක 830080, ඉහත සඳහන් සර්වේයර් ජනරාල්වරයාගේ පිඹුරෙහි කැබලි අංක 1[v], කැබලි අංක 8329 |

EOG 02 - 0042

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.